**මස්කෙළිය ප්‍රාදේශීය සභාව - 2020**
---------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය, පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අක්කර බදු හා වරිපනම් බදු වෙනුවෙන් ලබාදුන් රු.150,833 ක් වූ වට්ටම් මුදල් දුන් වට්ටම් ගිණුමට හර කරනු වෙනුවට ආධාර මුදල් සහ සහනාධාර ගිණුමට හර කළ ලෙස ජ'නල් අංක 5 හි සටහන් කර තිබුණද, ආධාර මුදල් සහ සහනාධාර ගිණුමට එම මුදල හර කර නොතිබුණි. | 2021 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ජර්නල් සටහන් මඟින් සිදු කරන ගැලපීම නිවැරදිව ගිණුම්වලට පිටපත් කළ යුතු වීම. |
| (ආ) | 2020 වර්ෂයේ ලැබීම් හා ගෙවීම්, ආදායම් හා වියදම් ගිණුම්වලට ගැලපීමේදී, ජ'නල් අංක 02 මඟින් හර කර තිබු මුළු එකතුව රු.90,353,748 ක් වූ අතර බැර කර තිබූ මුළු එකතුව රු.87,789,330 ක් වීමෙන් රු.2,564,418 ක වෙනසක් පැවතුණි. | ජ'නල් අංක 02 හි ලැබීම් හා ගෙවීම් වටිනාකම් වෙන වෙනම ගැලපීමත්, ලැබීම් වල මුළු වටිනාකම හා ගෙවීම් වල මුළු වටිනාකම මුදල් ගිණුමට හර හා බැර නොකොට, මුදල් ලැබීම් හා ගෙවීම් වටිනාකම් වෙනමම ගැලපීම නිසාත් මෙම වෙනස පෙන්නුම් කරන බව | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වැරදි හඳුනාගෙන නිවැරදි කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,308,018 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,897,062 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| 2020 වර්ෂය තුළ වරිපනම් බදු අය කිරීමරු.1,743,179 ක් වූ හිඟයෙන් රු.814,664 ක් හෙවත් සියයට 47 ක්ද, බිල් කළ රු.2,832,647 ක් වූ ආදායමින් අයවීම රු. 1,744,973 ක් හෙවත් සියයට 62 ක් ද ලෙස අවම මට්ටමක පැවතුණි. | 2021 පළමුවන කාර්තුව සඳහා අවසන් රතු නිවේදන නිකුත් කිරීමට කටයුතු කරමින් පවතී. | ආදායම් අය කිරීමට පියවර ගත යුතු වීම. |
| **(ආ) කුලී** | | |
| බිල්කළ ආදායම වර්ෂය තුළ අයකර ගැනීමට ක්‍රියාකළ යුතු වුවද, .සමාලෝචිත වර්ෂය තුළ කුලී ගාස්තු සඳහා බිල් කළ ආදායමින් අය වීම රු.3,210,600 ක් හෙවත් සියයට 42 ක් පමණක් විය. | කොවිඩ් හේතුවෙන් අය කළ නොහැකි මුදල් කපා හැරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කර ඇත. | ආදායම් අය කිරීමට පියවර ගත යුතු වීම. |
| **(ඇ) ටෙන්ඩර් බදු** | | |
| ටෙන්ඩර් මඟින් බදු දෙන දේපලවලින් අයවිය යුතු මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර අයකර අවසන් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.4,606,750 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. | හිඟ ටෙන්ඩර් මුදල් අයකර ගැනීම සඳහා මූලික නෛතික කටයුතු ආරම්භ කර ඇත. | ආදායම් අය කර ගැනීමට පියවර ගත යුතු වීම. |
| **(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | \ |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,275,704 ක් හා මුද්දර ගාස්තු රු.213,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් ලබාගැනීම සඳහා ඉල්ලීම් කර ඇත. | ආදායම් රුැස්කිරීමට කටයුතු කළ යුතුවේ.. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේදී සභාවට ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත්‍ර 67 අතරින් 2021 නොවැම්බර් 01 දින වනවිටත් අවසර පත්‍ර නිකුත් කර තිබුණේ අයදුම්පත්‍ර 50 කට පමණි. ඉඩම් ගැටළු හේතුවෙන් හා ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ අනුමැතිය මෙතෙක් ලබා නොගැනීම නිසා අයදුම්පත්‍ර 17 ක් මෙතෙක් අනුමත කර නොතිබුණි. | ඉඩම් ගැටළු හා ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ ගැටළු හේතුවෙන් අයදුම්පත්‍ර 17 ක් අනුමත කර නැත. අනවසර ඉදිකිරීම් සම්බන්ධ පසු විපරම් කර දැනුවත් කිරීමේ ලිපි යොමු කර ඇත. | කාර්යයන් කාර්යක්ෂමව ඉටුකළ යුතු වීම. |

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව යටතේ පවතින විවිධ ගොඩනැගිලි කර්මාන්ත සහ ඉදිකිරීම් පවතින ඉඩම් කොටස් 35 ක අයිතිය මේ වනවිට අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, විදුලි බල මණ්ඩලය හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව පවතින අතර ඒවායේ නීත්‍යානුකූල අයිතිය ප්‍රාදේශීය සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | මේ සම්බන්ධව දිස්ත්‍රික් ලේකම්තුමා හා ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කර ඇති බව. | අයිතිය නීත්‍යානුකූලව තහවුරු කර ගැනීම සඳහා වත්කම් පවරා ගත යුතු වීම. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 පාරිසරික ගැටලු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මස්කෙළිය ප්‍රාදේශීය සභාව 2018 වර්ෂයේදි ස්ථාපිත කළ පසුව, ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ලබා දිය යුතු, අඹගමුව ප්‍රාදේශීය සභාවෙන් නිකුත් කර දැනට කල් ඉකුත් වී ඇති බලපත්‍ර 27 කට සහ අළුතින් හඳුනාගත් ව්‍යාපාර 11 කට අදාළව පරිසර බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | පරිසර බලපත්‍ර නැවත අළුත් කිරීම සඳහා ලිපි යොමු කර ඇත. | පරිසර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතු වීම. |